සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

2088

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2014
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

නම :- ......................................................... විභාග අංකය :- .........................

- සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.



(01) මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ ......................................... පිළිමය යි.

(02) මෙම පිළිමය ......................................... යුගයට අයත් වේ.

(03) දකුණු අතින් ......................................... මුද්‍රාව දැක්වෙන අතර, වම් අතින් චීවරයේ රැල්ල දරා සිටියි.

(04) හිසට ඉහළින් දක්නට ලැබෙන ......................................... පසුව එකතු කරන ලද කොටසක් බවට මතයක් පවතියි.

(05) ඉන්දීය ......................................... කලා සම්ප්‍රදායේ බුදු පිළිමවල කලා ලක්ෂණ මෙහි දක්නට ඇතැයි විද්වත්හු පවසති.

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් හිස්තැනට සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

(06) ලාක්ෂා භාණ්ඩ අලංකරණ ක්‍රම දෙක පට්ටල් වැඩ හා ......................................... වැඩ යනුවෙන් හැඳින්වේ.

(07) අවුල්හැරය රටාව, වංකගිරිය රටාව හා තුන්පත් රටා ආදි සැරසිලි මෝස්තර ........................................... කර්මාන්තයේ දී භාවිත කෙරේ.

(08) වර්තමාන කැලණි ස්තූපයේ ගර්භය ........................................... හැඩයක් ගනී.

(09) වර්ණ කඩදාසි අතින් ඉරා සරල හැඩතල මතුවන සේ අලවා කරන ලද නිර්මාණ ........................................... චිත්‍ර නමින් හැඳින්වේ.

(10) පාරම්පරික චිත්‍ර ශිල්පියා කාන්තා රූප 5ක් ගලපා කළයක ආකාරයට කළ නිර්මාණය ........................................... නමින් හැඳින්වේ.

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් රූප සටහන **A, B, C, D, E** යන රූප අතරින් තෝරා එහි ඉංග්‍රීසි අක්ෂරය අදාළ චිත්‍රය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

(11)  (.....................)

(12)  (.....................)

(13)  (.....................)

(14)  (.....................)

(15)  (.....................)

A 

B 

C 

D 

E 

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර එහි ඇති වාක්‍ය අතුරින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(16) පනාවිටිය අම්බලම ප්‍රසිද්ධියක් උසුලන්නේ,

(1) ටෙරාකොටා කැටයම් සඳහා ය. (2) ලෝහ කැටයම් සඳහා ය.
(3) ගල් කැටයම් සඳහා ය. (4) දැව කැටයම් සඳහා ය.

(17) පොළොන්නරුව ගල් විහාරයේ බුදු පිළිමවල චීවරයේ ඇති විශේෂ ලක්ෂණය වනුයේ,

(1) ද්විත්ව රැළි දැක්වීමයි.
(2) දිය රැල්ලක අයුරින් රැළි දැක්වීමයි.
(3) රැළි නොදැක්වීමයි.
(4) ගැඹුරට හැරූ බණ්ඩනය වූ රැළි දැක්වීමයි.

(18) චලන මූර්තියක් තැනීමේ දී විශේෂයෙන් ම අවධානය යොමු කළ යුත්තේ,

(1) හැඩය පිළිබඳවයි. (2) ප්‍රමාණය පිළිබඳවයි.
(3) මාධ්‍ය පිළිබඳවයි. (4) සමබරතාව පිළිබඳවයි.

(19) චිත්‍රයක ළඟ දුර දැක්වීමේ සිද්ධාන්තය හැඳින්වෙන්නේ,

(1) ත්‍රිමාන ලක්ෂණ නමිනි. (2) පර්යාවලෝකය නමිනි.
(3) සම්පිණ්ඩනය නමිනි. (4) ද්විමාන ලක්ෂණ නමිනි.

(20) පෝස්ටර් චිත්‍රයක් නිර්මාණය කිරීමේ දී ඉතා වැදගත් කොට සැලකිය යුත්තේ,

(1) අකුරු සැරසිලි කිරීමයි. (2) දීප්තිමත් වර්ණ යෙදීමයි.
(3) පණිවුඩයේ වේගවත් බව ය. (4) හැඩතල සංකේතවත්ව යෙදීම ය.

- ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් අසා ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති තික් ඉර මත ලියන්න.

(21) වෙස්මුහුණු නිෂ්පාදනය සඳහා බහුල වශයෙන් කදුරු ලී භාවිත කෙරේ. ( )

(22) ඉසුරුමුණියෙහි පිහිටි ගලෙහි තෙලා ඇති 'මිනිසා හා අශ්ව හිස' කැටයම ගුප්ත කලා ශෛලියට අනුව නිමවා ඇත. ( )

(23) ක්‍රිස්තු දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසයක හැඩයක් ගනී. ( )

(24) දෙල්මඩ මූලාචාරින්ට හා ඔහුගේ ගෝලයින් හට ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම් නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවේ. ( )

(25) තිවංක පිළිමගෙයි ගර්භගෘහය තුළ දක්නට ඇති 'දේවාරාධනාව' හා සංකස්ස හිණිමං දර්ශනය අනුරාධපුර යුගයට අයත් වේ. ( )



The National e-Learning Portal for The General Education

◆ ප්‍රශ්න අංක 26 සිට 30 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සෙ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.

(26) තෛපොංගල් ..............................................................................................

(27) මූලික වර්ණ ..............................................................................................

(28) ආදිත්‍ය (ආදවත්) දේව මූර්තිය ..............................................................................................

(29) ප්‍රෙස්කෝ සිකෝ ..............................................................................................

(30) පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ..............................................................................................

◆ ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් එක් එක් වාක්‍යයෙන් කෙරෙන හැඳින්වීමට වඩාත් ගැළපෙන රූපය F, G, H, I, J යන රූප සටහන් අතුරෙන් තෝරා එහි ඉංග්‍රීසි අකුර අදාළ ප්‍රකාශය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.


F


G


H


I


J

(31) පොළොන්නරුවේ වටදාගෙයි සලපතල මළුව වටා ඇති බැම්මෙහි දක්නට ලැබෙයි. (........)

(32) විශ්වයේ පැවැත්ම හා විනාශය දක්වෙන කලා නිර්මාණයකින් උපුටා ගත්තකි. (........)

(33) මහනුවර යුගයේ උඩරට සිත්තම් ලක්ෂණ පෙන්නුම් කරයි. (........)

(34) ඉන්දීය ගන්ධාර ශිල්පියාගේ ශ්‍රේෂ්ඨ කලා කර්මාන්ත අතුරින් උපුටා ගත්තකි. (........)

(35) සාරානාත් ගුරු කුලයට අයත් ගුප්ත කලා ලක්ෂණ මැනවින් පිළිබිඹු කරන ප්‍රතිමාවකි. (........)

* ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් පහත දැක්වෙන කලාකෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අර්ථවත් වාක්‍ය 5ක් ලියන්න.



(36) හඳුනාගත් බව ..........................................................................................

..........................................................................................

(37) යුගය ..........................................................................................

..........................................................................................

(38) රේඛාව හා වර්ණ භාවිතය ..........................................................................................

..........................................................................................

(39) ශිල්ප ක්‍රමය ..........................................................................................

..........................................................................................

(40) ශිල්පීය කුසලතාව ..........................................................................................

..........................................................................................

(ලකුණු 1 × 40 = 40)